1) වොලිබෝල් තරඟයකදී පිරිනැමීම (Service) කිහිපවරක්ම වැරදි ලෙස සිදුකළ ආකාරය දකින්නට ලැබුණි.මෙම ක්‍රීඩකයන්ට නිවැරදි පිරිනැමීම සිදුකළ යුතු ආකාරය පැහැදිළි කොට දක්වන්න ?

2) උතුරු සහ දකුණු පළාත් අතර වොලිබෝල් තරගය විනිසුරු වශයෙන් ඔබ ක්‍රියාකරන්නේ නම් පහත සඳහන් අවස්ථාවලදී දෙනු ලබන තීරණ සඳහන් කරන්න

   a) උතුරු පළාත් කණ්ඩායමේ පිරිනමන ක්‍රීඩකයාට (Server) පිරිනැමීම සඳහා විනිසුරු සංඥාව දුන් වහාම දකුණු පළාත් කණ්ඩායමේ පසුපෙළ සිට පන්දු සකසන්නා (Setter) දැල අසලට ගමන් කිරීම

   b) දකුණු පළාත් කණ්ඩායමේ, ඉදිරි පෙළ ක්‍රීඩකයකු එල්ල කළ ප්‍රහාරය, උතුරු පළාත් කණ්ඩායමේ ක්‍රීඩකයකු, දැලට ඉහළින් විරුද්ධ පිලට දැන් යොමුකර වැළැක්වීම.

   c) උතුරු පළාත් කණ්ඩායමේ අංක 5 දරණ ක්‍රීඩකයාට, පිරිනැමීම සඳහා විනිසුරු සංඥාව ලබා දුන් පසු පන්දුව උඩ දමා ඇල්ලීම.

   d) දකුණු පළාත් කණ්ඩායමේ ලිබරෝ (Libero) ක්‍රීඩකයා, දැල උඩ පටියට ඉහළින් තිබූ පන්දුවට, පසු කලාපයේ සිට උඩ පැන පහර දීම.

   e) දකුණු පළාත් කණ්ඩායමේ ක්‍රීඩකයකු, වැළැක්වීම සඳහා සහභාගි වී පතිත වීමේ දී මැද රේඛාව (Center Line) ස්පර්ශ කරමින් පතිත වීම.